චක්‍රලේඛ අංක :- ..16../2014

මගේ අංක: ඩබ්/බලපත්‍ර/2014
බන්ධනාගාර මුලස්ථානය
කොළඹ 09
2014.04.29

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත,

## බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීම

ඉහත කරුණට අදාලව මගේ අංක : ඩබ්/08/2011 හා 2011.11.28 දිනැතිව නිකුත් කර ඇති අංක 26/2011 චක්‍රලේඛයට අමතරවයි.

02. 2014.04.28 දින පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජදීර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේදී පැවති අධිකාරී සාකච්ඡාවේදී යථෝක්ත කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කෙරින. ඊට අදාලව පුනරුත්ථාපන නිළධාරින් විසින් සකස් කෙරෙන සමාජ වාර්තා ගොනු සම්බන්ධයෙන් කිසිසේත්ම සෑහිමකට පත් විය නොහැකි බවට කරුණු වාර්තා කෙරින. විශේෂයෙන්ම ගොනු සකස් කිරිමේදි පෙනෙන නොසැලකිලිමත් භාවයත්, සාවද්‍ය තොරතුරු සැපයිමත්, සමහර පුනරුත්ථාපන නිළධාරින් ක්ෂේත්‍රයේ නොයෙදි අසත්‍ය තොරතුරු වාර්තා කිරිමත් බොහෝවිට දක්නට ලැබෙන බැවින් පුනරුත්ථාපන නිළධාරින්ගේ රාජකාරිය සම්බන්ධයෙන් සතුටට පත්විය නොහැකි බවත් සාකච්ඡාවට භාජනය කෙරින.

03. එබැවින් මින් ඉදිරියට සමාජ වාර්තා ගොනු සැකසිමේදි පහත සදහන් කරුණු තදින්ම පිළිපැදියයුතු ලෙසටත්, එසේ කටයුතු නොකරන පුනරුත්ථාපන නිළධාරින් සම්බන්ධයෙන් තදින්ම විනයානුකූලව ක්‍රියාකරන බවත් මෙයින් දන්වමි.

I. බලපත්‍ර මත නිදහස්විමට සුදුසුකම් ලබන සියළුම සිරකරුවන්ගේ නාම ලේඛණය/ විස්තර එකී ලේඛණ පරිදි සුදුසුකම් ලබන දිනයට මාස 06 කට පෙර ආයතනයේ අදාල අංශ වෙතින් ලබාගැනිමට පුනරුත්ථාපන නිළධාරින් විසින් වැඩ පිළිවෙලක් යොදා ගැනිම.

II. බලපත්‍ර මත නිදහස්විමට සුදුසුකම් ලබන සියළුම සිරකරුවන්ගේ ගොනු කාල සිමාවකින් තොරව සුදුසුකම් ලබන දිනය වනවිට බන්ධනාගාර මුලස්ථානයේ ලේකම්, බලපත්‍ර මණ්ඩලය වෙත යැවිමට ක්‍රියාකිරිම සහ නියමිත පරිදි සිරකරුවන් නිවාස නිවාඩු යැවිමට ක්‍රියා කිරිම.

III. දැනටමත් උපදෙස් දි ඇති පරිදි සමාජ වාර්තා ගොනු සැකසිමේදි සම්පුර්ණ කෙරෙන ප්‍රාථමික සම්මුඛ පරිකෂණ වාර්තාවේ පිටපතක් අදාල ක්ෂේත්‍රය භාර පුනරුත්ථාපන නිළධාරිට යැවිය යුතු අතරම පිටපතක් අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිටින පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය මගින් පත් කර ඇති සංවර්ධනය නිළධාරි වෙතින්ද ක්ෂේත්‍ර විමර්ශන වාර්තාවක් කැදවිම සදහා යැවිමට සියළුම පුනරුත්ථාපන නිළධාරින් වගබලා ගතයුතුය. බන්ධනාගාර මුලස්ථානයට සම්පුර්ණ කල

සමාජ වාර්තා ගොනුව එවිමේදි එකී වාර්තාවද සහිත්ව ගොනුව ඉදිරිපත් කලයුතුය. නිවාස නිවාඩු යැවිමේදි ද එපරිදිම වාර්තා කැදවිමට පුනරුත්ථාපන නිළධාරින් ක්‍රියා කලයුතුය.

IV. පුනරුත්ථාපන නිළධාරින් තමන්ගේ මුලික රාජකාරි වගකිමක් සේ සලකා ක්ෂේත්‍ර විමර්ශනයේ යෙදිය යුතුය. සාවද්‍ය තොරතුරු වාර්තා නොකල යුතුය. විශේෂයෙන්ම වින්දිත පාර්ශවය සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම පැහැදිලිව කරුණු වාර්තා කිරිමක් ක්ෂේත්‍ර විමර්ශන වාර්තාවේ ඇතුලත් කල යුතුය. ඔවුනු මුණගැසිය යුතුය. විශේෂයෙන්ම ප්‍රදේශයේ ග්‍රාම නිළධාරි සහ ප්‍රභූන් ගෙන් මෙකී කරුණු සනාථ කරගත යුතුය. දැනටමත් බලපත්‍ර මණ්ඩලය විසින් මොවුන් බලපත්‍ර මත නිදහස් කිරිමට කරුණු සලකා බැලිමේද ඉහත කී කරුණු පුනරුත්ථාපන නිළධාරින් නිවැරදි ආකාරයෙන් වාර්තා නොකිරිම ගැටළු සහගත වි ඇත. පුනරුත්ථාපන නිළධාරින් සමාජ වාර්තා ගොනු අධිකාරි හරහා බන්ධනාගාර මුලස්ථානයට එවිමට පෙර මෙම සමාජ වාර්තා ගොනු සම්බන්ධයෙන් අධිකාරි විසින් පෞද්ගලිකව අධික්ෂණයට ලක්කල යුතුය.

V. පුනරුත්ථාපන නිළධාරින් විසින් සකස් කෙරෙන ඉහත කී සමාජ වාර්තා ලිපි ගොනු ඉතාමත් සැලකිලිමත්ලෙසත්, පිරිසිදුව, පැහැදිලිව සහ නිවැරදිව එවිමට පුනරුත්ථාපන නිළධාරින් තරයේ වගබලා ගත යුතුය.

මෙකී කරුණු සම්බන්ධයෙන් <u>ඔබගේ විශේෂ අවධානය</u> යොමු කරන මෙන් වැඩි දුරටත් දන්වමි.
මෙම චක්‍රලේඛය ලැබුණු බව දන්වා සිටිය යුතුය.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

01. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය
ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

02. ලේකම්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

03. අතිරේක ලේකම් (සංවර්ධන),
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

04. ගරු සභාපති
බලපත්‍ර මණ්ඩලට, බන්ධනාගාර මුලස්ථානය

} කාරුණික දැනගැනිම පිණිස